# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2001 අංක 6 දරන ආදායම් බදු අධිභාර පනත

---

**[සහතිකය සටහන් කලේ 2001 අප්‍රේල් මස 11 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2001 අප්‍රේල් මස 12 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5.75 යි.

තැපැල් ගාස්තුව : රු. 3.50 යි.

# 2001 අංක 6 දරන ආදායම් බදු අධිභාර පනත

[සහතිකය සටහන් කළේ 2001 අප්‍රේල් මස 11 වන දින]

එල්.ඩී.—ඕ. 13/2001.

**2001 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු අය කරනු ලැබීමට යටත් සෑම සමාගමක් විසින් ම, ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද අනුසාරයෙන් ඒ සමාගම් විෂයයෙහි අධිභාරයක් නියම කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණ සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2001 අංක 6 දරන ආදායම් බදු අධිභාර පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනතෙහි මින් මතු "අදාළ වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන, 2001 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා, දේශීය ආදායම් පනත යටතේ බදු අය කරනු ලැබීමට යටත් වන සෑම සමාගමක් ම, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද ඒ සමාගම විසින් ඒ අදාළ වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්දෙන් සියයට විස්සක අනුප්‍රමාණය අනුව ගණන් බලනු ලැබූ අධිභාරයක් (මේ පනතෙහි මින් මතු "අධිභාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) අදාළ වර්ෂය සඳහා සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්ද මත ගෙවීමට යටත් විය යුතු ය. සමාගම් විසින් ගෙවිය යුතු ආදායම් බද්ද මත අධිභාරය නියම කිරීම.

**3.** මේ පනත යටතේ අධිභාරයක් ගෙවීමට යටත් සෑම සමාගමක් විසින් ම, ඒ සමාගම විෂයයෙහි තක්සේරුවක් කරනු ලැබ නොතිබුණ ද, අදාළ වර්ෂය සඳහා සමාගම විසින් ගෙවනු ලැබිය යුතු අධිභාරයේ මුදලින්— අධිභාරය ගෙවිය යුතු දින.

(අ) සියයට පණහකට නොඅඩු ප්‍රමාණයක් 2001 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර ද ;

(ආ) එහි ශේෂයට සමාන මුදලක්, 2001 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර ද,

කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවිය යුතු ය. එසේ ගෙවිය යුතු මුදල, මෙහි මින් මතු මේ පනතෙහි "වාරිකය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

2—H 011625-4,400(2001/04)

ගෙවීම පැහැර හැර ඇති අධිභාර සහ ඊට එකතු කරනු ලබන මුදල් ප්‍රමාණ.

4. (1) අදාළ වර්ෂය සඳහා යම් සමාගමක් විසින් ගෙවිය යුතු අධිභාරයේ වාරිකයක් හෝ ඒ වාරිකයකින් කොටසක්, ඒ වාරිකය ගෙවීම සඳහා 3 වන වගන්තියේ නියමිත දිනයේ දී හෝ ඊට පෙර ගෙවා නොමැති අවස්ථාවක, අධිභාරයේ ඒ වාරිකය හෝ එහි කොටස ගෙවීම පැහැර හැර ඇතැයි සලකනු ලැබිය යුතු අතර ඒ සමාගම ගෙවීම් පැහැර හරින්නකු ලෙස මේ පනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(2) අධිභාරයේ යම් වාරිකයක් හෝ වාරිකයකින් කොටසක් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, පැහැර හරින්නා විසින් ගෙවීම් පැහැර හැර තිබෙන වාරිකයට හෝ එහි කොටසට අතිරේකව—

(අ) ගෙවීම් පැහැර හැර තිබෙන මුදල් ප්‍රමාණයෙන් සියයට දහයකට සමාන මුදලක් ; සහ

(ආ) පැහැර හරිනු ලැබීම පටන් ගැනීමෙන් පසුව දින තිහක් ඉකුත්වීමට පෙර එසේ ගෙවීම පැහැර හරිනු ලැබූ මුදල ගෙවනු නොලැබූ අවස්ථාවක, එම පැහැර හැරීම කරගෙන යනු ලබන එක් එක් දින තිහක කාලසීමාව හෝ ඉන් කොටසක් වෙනුවෙන්, එසේ ගෙවීම් පැහැර හැර තිබෙන මුදල් ප්‍රමාණයෙන් සියයට දෙකකට සමාන වැඩිදුර මුදලක්,

දණ්ඩන මුදලක් වශයෙන් ගෙවිය යුතු ය :

එසේ වුව ද—

(අ) මේ වගන්තියෙන් ඉහතින් ම වූ විධිවිධාන යටතේ දණ්ඩනයක් වශයෙන් ගෙවිය යුතු මුළු මුදල කිසිම අවස්ථාවක, පැහැර හරිනු ලැබ ඇති අධිභාර මුදලින් සියයට පණහක් නො ඉක්මවිය යුතු ය ;

(ආ) මේ පනත යටතේ, අදාළ වර්ෂය සඳහා අධිභාරය ගෙවීමට යටත් යම් සමාගමක් විසින්, 2000 අප්‍රේල් මස 01 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය වෙනුවෙන් දේශීය ආදායම් පනත යටතේ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්—

(i) සියයට දහයකට නොඅඩු ප්‍රමාණයක්, 2001 අගෝස්තු මස 15 වන දින හෝ ඊට පෙර ඒ

සමාගම විසින් ගෙවනු ලැබිය යුතු වාරිකය වශයෙන්, එම දින දී හෝ ඊට පෙර ගෙවනු ලැබූ ; සහ

(ii) සියයට දහයකට නොඅඩු ප්‍රමාණයක්, 2001 නොවැම්බර් මස 15 වන දින හෝ ඊට පෙර ඒ සමාගම විසින් ගෙවනු ලැබිය යුතු වාරිකය වශයෙන්, එම දින දී හෝ ඊට පෙර ගෙවනු ලැබූ

අවස්ථාවක, එම සමාගම විසින් ඉහත කී පරිදි ගෙවන ලද මුදල් ප්‍රමාණවල එකතුව ඉක්මවන, අදාළ වර්ෂය සඳහා සමාගම ගෙවිය යුතු අධිභාරයේ අතිරික්තය 2002 නොවැම්බර් මස 30 වන දින හෝ ඊට පෙර සමාගම විසින් ගෙවනු ලැබුවහොත්, ඒ සමාගම, මේ වගන්තිය යටතේ කිසිදු දණ්ඩන මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය ;

(ඇ) අදාළ සියලු අවස්ථානුගත කරුණු අනුව යම් අඩු කිරීමක් හෝ අත් හැරීමක් කිරීම යුක්තිසහගත යයි හෝ සාධාරණ යයි කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නේ නම්, මේ වගන්තිය යටතේ ගෙවිය යුතු යම් දණ්ඩන මුදලක් කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩු කරනු ලැබිය හැකි ය ; නැතහොත් අත්හරිනු ලැබිය හැකි ය.

දේශීය ආදායම් පනතේ ඇතැම් විධිවිධාන අදාළ විය යුතු බව.

**5.** දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්දට අදාළ වාර්තා සැපයීම, ඒ බද්ද තක්සේරු කිරීම, තක්සේරුවට විරුද්ධව කරනු ලබන අභියාචන, තක්සේරුවේ අවසානාත්මකභාවය, ඒ බද්ද අයකර ගැනීම හා ආපසු ගෙවීම, ඒ බද්ද හා සම්බන්ධ විවිධ කරුණු, දණ්ඩන හා වැරදි, එහි පරිපාලනය හා ඒ බද්ද පිළිබඳ පොදු කරුණු සම්බන්ධයෙන් දේශීය ආදායම් පනතේ XII පරිච්ඡේදයේ සහ XVIII වන පරිච්ඡේදයේ සිට XX වන පරිච්ඡේදය තෙක් වූ පරිච්ඡේදවල සහ XXII වන පරිච්ඡේදයේ සිට XXVII වන පරිච්ඡේදය තෙක් වූ පරිච්ඡේදවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ පනත යටතේ ගෙවිය යුතු අධිභාරයට අදාළ වාර්තා සැපයීම, අධිභාරය තක්සේරු කිරීම, තක්සේරුවට විරුද්ධව කරනු ලබන අභියාචන, තක්සේරුවේ අවසානාත්මකභාවය, එම අධිභාරය අයකර ගැනීම සහ ආපසු ගෙවීම ඒ අධිභාරය හා සම්බන්ධ විවිධ කරුණු, දණ්ඩන හා වැරදි, එහි පරිපාලනය සහ ඒ අධිභාරය පිළිබඳ පොදු කරුණු සම්බන්ධයෙන්, පහත දැක්වෙන සුළු වශයෙන් වූ වෙනස් කිරීම් වලට යටත්ව, අදාළ විය යුතු ය :—

(අ) දේශීය ආදායම් පනතේ 98 වන වගන්තියේ (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ අදාළ වර්ෂය සඳහා ස්වකීය ආදායම පිළිබඳ වාර්තාවක් යම් සමාගමක් විසින් සපයනු ලැබුවහොත්, ඒ වර්ෂය සඳහා මේ පනත යටතේ එම සමාගම විසින් ගෙවිය යුතු අධිභාරය පිළිබඳ වාර්තාවක් සැපයීමට ඒ සමාගම වෙත මේ පනතින් පනවන ලද නියමය අනුව ප්‍රමාණවත්ව කටයුතු කර ඇතැයි සලකනු ලැබිය යුතු ය ;

(ආ) දේශීය ආදායම් පනත යටතේ අදාළ වර්ෂය සඳහා යම් සමාගමක් විසින් ගෙවිය යුතු ආදායම් බද්ද සම්බන්ධයෙන් ඒ සමාගම පිළිබඳව තක්සේරුකරුවකු විසින් තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් හෝ කරනු ලබන අවස්ථාවක, ඒ තක්සේරුකරු විසින් ඒ අවස්ථාවේ දී ම, සහ එම ආකෘතියෙහි ම මේ පනත යටතේ ඒ වර්ෂය සඳහා ඒ සමාගම විසින් ගෙවනු ලැබිය යුතු අධිභාරය සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි, තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු ලැබිය හැකි ය. ඒ තක්සේරු කිරීම හෝ අතිරේක තක්සේරු කිරීම, අවස්ථාවෝචිත පරිදි ඒ ඒ අදාළ පනත් යටතේ නිකුත් කරන ලද වෙන වෙනම වූ තක්සේරු ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඇ) අදාළ වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ යම් සමාගමකින් අය කරන ආදායම් බද්දේ ප්‍රමාණය සඳහන් කරමින්, දේශීය ආදායම් පනතේ 135 වන වගන්තිය යටතේ ඒ සමාගම වෙත තක්සේරු දැන්වීමක් දෙනු ලබන අවස්ථාවක, ඒ වර්ෂය සඳහා මේ පනත යටතේ ඒ සමාගමෙන් අය කරන අධිභාරයේ මුදල් ප්‍රමාණය ද ඒ දැන්වීමෙහි ඇතුළත් කරනු ලැබිය හැකි ය. ඒ දැන්වීම්, ඒ ඒ පනත් යටතේ නිකුත් කරන ලද වෙන වෙනම වූ දැන්වීම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඈ) අදාළ වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ යම් සමාගමක් විසින් ගෙවිය යුතු ආදායම් බදු තක්සේරුවට විරුද්ධව අභියාචනයක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ අභියාචනයට, මේ පනත යටතේ ඒ වර්ෂය සඳහා ගෙවිය යුතු අධිභාරයට විරුද්ධ අභියාචනයක් ද ඇතුළත් වන සේ සලකනු ලැබිය යුතු අතර, ඒ අභියාචනය ඒ අනුව තීරණය කරනු ලැබිය යුතු ය ; තව ද

(ඉ) දේශීය ආදායම් පනතේ XXII වන පරිච්ඡේදය යටතේ මහෙස්ත්‍රාත්වරයකු වෙත සහතිකයක් නිකුත් කරනු ලැබ ඇත්තා වූ හෝ යම් සමාගමක් වෙත දැන්වීමක්, ප්‍රකාශයක් හෝ සහතිකයක් නිකුත් කරනු ලැබ ඇත්තා වූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ මහෙස්ත්‍රාත්වරයා වෙත නිකුත් කර තිබෙන සහතිකයෙහි හෝ යම් සමාගමක් වෙත නිකුත් කර තිබෙන දැන්වීමෙහි, ප්‍රකාශයෙහි හෝ සහතිකයෙහි, මේ පනත යටතේ ගෙවීම් පැහැර හැර ඇති අධිභාරයේ යම් මුදල් ප්‍රමාණයක් පිළිබඳ විස්තර ද ඇතුළත් කරනු ලැබිය හැකි ය. අවස්ථාවෝචිත පරිදි මහෙස්ත්‍රාත්වරයා වෙත නිකුත් කරන ඒ සහතිකය සහ යම් සමාගමක් වෙත නිකුත් කරන ඒ දැන්වීම්, ප්‍රකාශ හෝ සහතිකය ඒ ඒ පනත් යටතේ නිකුත් කරන ලද වෙන වෙනම වූ දැන්වීම්, ප්‍රකාශ හෝ සහතික ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**7.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි :—

'තක්සේරුකරු', 'කොමසාරිස් ජනරාල්', 'නිර්වාසික සමාගම', 'වාසික සමාගම' සහ 'තක්සේරු වර්ෂය' යන යෙදුම්වල, දේශීය ආදායම් පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය

'සමාගම' යන්නෙන්, ශ්‍රී ලංකාවේ හෝ අන් කිසි තැනක හෝ බලපවත්නා යම් නීතියක් යටතේ සංස්ථාගත කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ යම් සමාගමක් අදහස් වන අතර, ඊට යම් රාජ්‍ය සංස්ථාවක් ද ඇතුළත් වන සේ සැලකිය යුතු ය.

'ආදායම් බද්ද' යන්න අදාළ වර්ෂය හා සම්බන්ධව යෙදීමේ දී සහ—

(i) වාසික සමාගමක් සම්බන්ධයෙන් වන විට දේශීය ආදායම් පනතේ—

(අ) 53 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ), (ඇ) හෝ (ඇ) ඡේදය යටතේ ඒ සමාගම විසින් ඒ වර්ෂය සඳහා ගෙවිය යුතු යම් බද්දක ;

(ආ) 92 වන වගන්තියේ සඳහන් යම් ගිවිසුමකට අනුකූලව හෝ 93 වන වගන්තිය යටතේ හෝ ඒ සමාගමට ආදායම් බද්ද සම්බන්ධයෙන් ප්‍රදානය කරන ලද සහනයක,

මුළු මුදල අඩු කිරීමෙන් පසු, ඒ සමාගම විසින් ඉහත කී පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද අදහස් වේ ; තව ද

(ii) නිර්වාසික සමාගමක් සම්බන්ධයෙන් වන විට, ඉහත කී පනතේ 57 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදය හෝ (ii) වන අනුඡේදය යටතේ අදාළ වර්ෂය සඳහා ඒ සමාගම විසින් ගෙවිය යුතු යම් ආදායම් බදු මුදලක් අඩු කිරීමෙන් පසුව, ඒ සමාගම විසින්, අදාළ වර්ෂය සඳහා ඉහත කී පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද අදහස් වේ.

'දේශීය ආදායම් පනත' යන්නෙන්, 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත අදහස් වේ.

'රාජ්‍ය සංස්ථාව' යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනත හැර, වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවනු ලැබුවා වූ හෝ ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු ප්‍රාග්ධනය හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.